සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I	කාලය / நேரம் / Time: පැය 01යි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) ලෝහ කර්මාන්තය ඈත අතීතයකට උරුමකම් කියයි. ක්‍රි.පූ. 4000 දී පමණ සොයාගන්නා ලද ලෝහයන් වන්නේ,
(1) තඹ , ඇලුමිනියම්
(2) තඹ , ලෝකඩ
(3) ලෝකඩ , නිකල්
(4) නිකල් , පිත්තල

(02) අමිශ්‍ර නිෆෙරස් ලෝහයක් වන්නේ ,
(1) ඊයම්
(2) පිත්තල
(3) වානේ
(4) සිද්ධ යකඩ

(03) සිද්ධ යකඩ තැනීම සඳහා යොදා ගනු ලබන ලෝහයක් වන්නේ,
(1) ටංස්ටන්
(2) තඹ
(3) ඊයම්
(4) ටින්

(04) කාර්මිකයෙකුට කාර්මික කටයුතු කිරීමේ දී වැදගත් වන ලෝහ ගුණය වන්නේ,
(1) නිෂ්පාදිත ගුණයන්ය
(2) රසායනික ගුණයන්ය
(3) යාන්ත්‍රික ගුණයන්ය
(4) විද්‍යුත් ගුණයන්ය

(05) රත්තරන් ලෝහයේ ආවේනික වර්ණය වන්නේ,
(1) තැඹිලි වර්ණයයි
(2) කහ සහ සුදු වර්ණයයි
(3) රන් පැහැ වර්ණයයි
(4) කහ වර්ණයයි

(06) ආහන්‍යතාවයෙන් යුත් ලෝහයක් වන්නේ,
(1) චීනචට්ටි
(2) සුදු යකඩ
(3) ටින්
(4) ඩ්‍යුරලමින්

(07) තන්‍යතාවය යනු,
(1) දෙදිසාවට ඇදීමේ දී නොකැඩී දික් වූ ප්‍රමාණයට ස්ථිරව තිබීම
(2) ඇදීමේ දී නැවත තිබූ ප්‍රමාණයට පැමිණීම
(3) පිපිරීම් වලින් තොරව තිබීම
(4) ස්ථිරවම වෙනස් කළ නොහැකි වීම

(08) සිඩරයිට් (යකඩ කාබනේට) ලැබෙන ප්‍රදේශයක් වන්නේ,
(1) ස්වීඩනය
(2) නෝර්වේ
(3) රුසියාව
(4) ජර්මනිය

(09) චීනචට්ටි නිෂ්පාදනයේ දී මිශ්‍ර කර ගනු ලබන කාබන් ප්‍රතිශතය වන්නේ,
(1) 2.25% - 4.3% කි.
(2) 2.00% - 4.00% කි
(3) 1.25% - 3.3% කි
(4) 3.03% - 3.25% කි


Past Papers Wiki

(10) අධිකාබන් වානේ යොදා නිෂ්පාදනය කරනු ලබන උපකරණයක් වන්නේ,
(1) පිස්ටන් (2) පිරි (3) දුනුකොළ (4) තල්ලු දඬු

(11) තඹවල ද්‍රවාංකය වන්නේ,
(1) 1033 ^{0}C කි (2) 419 ^{0}C කි (3) 1030 ^{0}C කි (4) 231 ^{0}C කි

(12) ලෝකඩ තැනීමේ දී යොදා ගනු ලබන ලෝහයක් වන්නේ ,
(1) තුත්තනාගම් - ඊයම් (2) තඹ - තුත්තනාගම්
(3) තඹ - ටින් (4) ඊයම් - ටින්

(13) පහත රූපයේ දැක්වෙන නිර්මාණ ක්‍රමය වන්නේ,
(1) නිදහස් රූපීය පෙනුමයි
(2) ත්‍රිමාන පෙනුමයි
(3) පර්යාලෝක පෙනුමයි
(4) සමාංශක පෙනුම යි



(14) වානේ කෝදුවෙන් ලබාගත හැකි කුඩාම බ්‍රිතාන්‍ය ඒකක මිනුම වන්නේ,
(1) අඟල් 1/32 (2) අඟල් 1/64 (3) අඟල් 1/16 (4) අඟල් 1/8

(15) පහත රූපයේ දැක්වෙන උපකරණය වන්නේ ,
(1) මුළු මට්ටමකි
(2) කැලිපරයකි
(3) බෙදුම් කටුවකි
(4) ස්වාය මට්ටමකි



(16) අත් දඬු අඩුව යොදා ගෙන සිදු කරනු ලබන කාර්යයක් වන්නේ ,
(1) ලෝහ බට හිරකර අල්ලා ගැනීම සඳහා ය.
(2) කුඩා සියුම් වැඩ කොටස් අල්ලා ගැනීම සඳහා ය.
(3) වැඩ බංකුවට අල්ලා ගැනීම සඳහා ය.
(4) හැඩ ගැන්විය යුතු කොටස් අල්ලා ගැනීම සඳහා ය.

(17) පහත රූපයේ දැක්වෙන උපකරණය වන්නේ,
(1) රබර් මිටියකි (2) ලී මිටියකි
(3) ලෝහ මිටියකි (4) හැඩ මිටියකි



(18) කාර්මිකයකු බර වැඩ කිරීමේ දී මිටියෙන් පහර දීම සිදුකරනු ලබන්නේ,
(1) අතේ මැණික් කටුව උපයෝගී කරගෙන ය.
(2) අත් දෙක ම උපයෝගී කරගෙන ය.
(3) වම් අතින් පමණක් උපයෝගී කරගෙන ය.
(4) අතේ වැලමිට උපයෝගී කරගෙන ය.

(19) ලෝහ කොටසක් පිරිගැමෙන් පසු සිදුකළ යුතු ක්‍රියාවක් වන්නේ ,
(1) පිර එල්ලා තැබීම (2) ඇසුරුමක බහාලීම
(3) කම්බි බුරුසුවකින් පිරිසිදු කිරීම (4) වැඩ මේසය මත තැබීම

(20) ලෝහ කියතක කියත් තලය තබා තද කිරීමට යොදා ගනු ලබන මුරිච්චිය වන්නේ ,
(1) සමනල මුරිච්චිය (2) පොට මුරිච්චිය
(3) ස්කුරුප්පු මුරිච්චිය (4) ලොක් මුරිච්චිය

Past Papers Wiki

(21) තහඩු කතුරක මුවහත් කෝණය වන්නේ,
(1) 87^0 කි (2) 67^0 කි (3) 90^0 කි (4) 107^0 කි

(22) ගිනි නිවීමේ ක්‍රම අතුරින් "ස්මෝදරන් ක්‍රමය" මගින් සිදු කරනු ලබන්නේ ,
(1) වාතය ඉවත් කිරීම (2) උෂ්ණත්වය ඉවත් කිරීම
(3) ඇවිලෙන සුළු ද්‍රව්‍ය ඉවත් කිරීම (4) ජලය ඉවත් කිරීම

(23) ජල ගිනි නිවන උපකරණයේ වර්ණ කේතය වන්නේ ,
(1) නිල් පාට (2) රතු පාට (3) කළු පාට (4) ක්‍රීම් පාට

(24) "ඒ " (A) වර්ගයේ ගින්නක් මැඩ පැවැත්වීමට භාවිත ද්‍රව්‍යයක් වන්නේ,
(1) පෙන ගිනි නිවනය (2) වැලි
(3) කාබන්ඩයොක්සයිඩ් වායුව (4) විශේෂ වායු

(25) ගිනි වර්ගීකරණයට අනුව "ඊ " (E) වර්ගයේ ගින්නක් යනු"
(1) තෙල් ගිනි (2) ලෝහ ගිනි
(3) රසායනික ගිනි (4) විදුලි ගිනි

(26) වාමුවා පිස්නය ක්‍රියා කිරීමේ දී ඇතිවන චලිතාකාරය වන්නේ ,
(1) රේඛීය චලිතය (2) භ්‍රමණ චලිතය (3) දෝලන චලිතය (4) අණුවැටුම් චලිතය

(27) පහත රූපයේ දැක්වෙන්නේ,
(1) දහර කඳකි (2) ඇඹරුම් කටුවකි
(3) දම්වැලකි (4) පුරුක් සබැඳුමකි




(28) පහත රූපයේ දැක්වෙන චලිත පරිවර්තනය වන්නේ,
(1) භ්‍රමණ චලිතය - අනුවැටුම් චලිතය
(2) භ්‍රමණ චලිතය - රේඛීය චලිතය
(3) භ්‍රමණ චලිතය - භ්‍රමණ චලිතය
(4) දෝලන චලිතය - රේඛීය චලිතය



(29) ගොළුබෙලි කැමියක කැරකුම් දිශාව වන්නේ,
(1) වාමාවර්තවය (2) දෝලනය වෙමින්ය (3) දක්ෂිණාවර්තවය (4) සිරස්වය

(30) පහත රූපයේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ප්‍රාථමික දහරය (2) ද්විතීක දහරය
(3) චුම්භකය (4) ගැල්වනෝමීටරය



(31) පුලිඟු පේනුවක අග්‍ර පරතරය පරීක්ෂා කරනු ලබන උපකරණය වන්නේ ,
(1) මිනුම් පටිය (2) ස්පර්ශක අමානය
(3) ව'නියර් කලපාසය (4) මල්ටිමීටරය

(32) පිළිස්සීමක දී පිළිස්සුණු ස්ථානය ජලයෙන් තෙමීම සිදු කරයි. එම කාලය වන්නේ ,
(1) විනාඩි තිහකි (2) විනාඩි පහළොවකි
(3) විනාඩි දොළහකි (4) විනාඩි විස්සකි

(33) පුලිඟු පේනුවක අග්‍ර අතර පරතරය වන්නේ,
(1) 0.50mm සිට 1.0 mm දක්වා (2) 0.60mm සිට 2.0 mm දක්වා
(3) 0.60mm සිට 1.0 mm දක්වා (4) 0.60mm සිට 1.60 mm දක්වා

(34) පට්ටම් ගියර භාවිතයෙන් සිදු කරනු ලබන්නේ,

(1) දිශාව 60^0 කින් වෙනස් කිරීමයි (2) දිශාව 90^0 කින් වෙනස් කිරීමයි

(3) දිශාව 120^0 කින් වෙනස් කිරීමයි (4) දිශාව 45^0 කින් වෙනස් කිරීමයි

(35) ස්නේහන තෙල් වල දුස්ස්‍රාවීයතාවය මැනීම සඳහා භාවිත කරනු ලබන්නේ,

(1) සේබෝල්ට් මීටරය (2) මල්ටිමීටරය

(3) ඔයිල් මීටරය (4) වෝල්ට් මීටරය

(36) පහත රූපයේ දැක්වෙන්නේ ,

(1) බෙයාරිමකි

(2) ජලපොම්පයකි

(3) උෂ්ණත්වපාලන වැල්වයකි

(4) දහරදුන්නකි



(37) විකිරණය නිපදවීමේ දී යොදා ගන්නා ලෝහ වර්ගයක් වන්නේ,

(1) සුදු යකඩ (2) වානේ (3) ලෝකඩ (4) තඹ


(38) රූපයේ දැක්වෙන්නේ ,

(1) දෙවන පන්නයේ ලීවර ක්‍රමයකි

(2) පළමු පන්නයේ ලීවර ක්‍රමයකි

(3) තෙවන පන්නයේ ලීවර ක්‍රමයකි

(4) දඬු ලීවර ක්‍රමයකි



(39) ඉලිප්සයක දිග වැඩිම ස්ථාන දැක්වෙන රේඛාව හඳුන්වන්නේ ,

(1) මහා අක්ෂයයි (2) සුළු අක්ෂයයි (3) AB රේඛාවයි (4) දීර්ඝ රේඛාවයි

(40) කේතුවක් ඇල උසට සමාන්තරව කැපීමෙන් ලැබෙන මුහුණත් හැඩය වන්නේ,

(1) වෘත්තයකි (2) ඉලිප්සයකි (3) පරාවලයකි (4) බහුවලයකි

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II	කාලය நேரம் Time: පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **පළමුවන ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න 04ක් ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු වන ප්‍රශ්නයට ලකුණු 20ක්ද තෝරාගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද ලැබේ.**


(01) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම විශ්ව භාෂාවක් වේ.
(* සියලු ම මිනුම් මිලිමීටරවලිනි. * නිර්මාණ රේඛා පැහැදිලිව තිබිය යුතු ය.)
(අ) පරිමිතිය 120mm වූ පාද අතර අනුපාතය 3 : 4 : 5 වූ ද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න. (ලකු. 15)
(ආ) අරය 40mm වූ වෘත්තයක් තුළ සවිධි ෂඩස්‍රයක් නිර්මාණය කරන්න. (ලකු. 5)

(02) කර්මාන්ත ශාලාවක් තුළ කාර්මික කටයුතු සිදුකිරීමේ දී ආරක්ෂාව ඉතා වැදගත් වේ.
(i) කර්මාන්ත ශාලාවක "ක්‍රමානුකූල බව" යන්න විස්තර කරන්න. (ලකු. 2)
(ii) වැඩබිමක ක්‍රමානුකූල බව පවත්වා ගැනීමට තිබිය යුතු ගුණාංග 4 ක් සඳහන් කරන්න. (ලකු. 4)
(iii) කාර්මික විනය උසස් මට්ටමක පවත්වා ගැනීමට කාර්මිකයන් විසින් සිදු කළ යුතු ක්‍රියාවන් 4ක් සඳහන් කරන්න. (ලකු. 4)

(03) කාර්මිකයන් නවීන ලෝකයට ගැළපෙන භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි උනන්දුවක් දක්වයි.
(i) භාණ්ඩ තැනීමේ දී අනුගමනය කළ යුතු පියවර දෙකක් විස්තර කරන්න. (ලකු. 2)
(ii) ලෝහවලින් භාණ්ඩ තැනීමේ දී ද්‍රව්‍ය කොටස් වලට වෙන් කිරීමට ආවුද හා උපකරණ භාවිත කරයි. ඒ සඳහා භාවිත කරන උපකරණ 4ක් සඳහන් කරන්න. (ලකු. 4)
(iii) ආවුද හා උපකරණ භාවිතයේ දී ශිල්පීය ක්‍රම අනුගමනය නොකිරීමෙන් ඇතිවන අවාසි 4ක් සඳහන් කරන්න. (ලකු. 4)

(04) මෝටර් රථ එන්ජින් වල චලනය වන කොටස් නොකඩවා ස්නේහණය සිදුකළ යුතුය.
(i) ස්නේහන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකු. 2)
(ii) ඉහත (i) හි සඳහන් කරන ලද ස්නේහන ක්‍රමයක ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකු. 4)
(iii) මෝටර් රථයක් පනගැන්වීමේ දී ස්නේහන පද්ධතිය දෝෂ සහිත බව දැකගත හැකි ක්‍රමයක් සඳහන් කර එම දෝෂ ඇතිවීමට බලපෑ හේතු 2ක් සඳහන් කරන්න (ලකු. 4)

(05) සිසිලන පද්ධතිය ප්‍රධාන උපාංග කිහිපයකින් සමන්විත වෙයි.
(i) ඉහත රූපයේ A,B හා C නම් කරන්න. (ලකු. 3)
(ii) B හා C කොටස්වලින් සිදුවන කාර්යය වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකු. 4)
(iii) විකිරක ජලය රත්වී ඇති විට නොකළ යුතු ක්‍රියා 2ක් සඳහන් කරන්න. (ලකු. 3)



PAST PAPERS WIKI

Past Papers Wiki

(06) නූතන මිනිසා නවීන යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනයට වැඩි උනන්දුවක් දක්වයි.

(i) නවීන යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කිරීමේ මූලික අරමුණ වන්නේ, පැහැදිලි කරන්න. (ල. 2)

(ii) ගැටළු විසඳීමේත් ක්‍රියාවලියේ මූලික අංග 4ක් සඳහන් කරන්න. (ල. 4)

(iii) ඔබගේ තාක්ෂණ අංශයේ හඳුනාගත් ගැටළු 2ක් සඳහන් කර එම ගැටළු දෙක සඳහා ගත් විසඳුම් දෙකේ කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)

(07) වෙනත් ස්ථානයක උත්පාදනය කරන බලය තවත් තැනකට ගෙනයාම ජව සම්ප්‍රේෂණය වේ. විවිධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජව සම්ප්‍රේෂණය ඇත අතීතයේ සිටම භාවිත කර ඇත.

(i) ශක්තිය යනු පැහැදිලි කරන්න. (ල. 2)

(ii) ජවය සම්ප්‍රේෂණය කිරීමට යොදා ගෙන ඇති ක්‍රම 4ක් සඳහන් කරන්න. (ල. 4)

(iii) ජවය සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රම මගින් විවිධ ක්‍රියාවන් සිදු කරනු ලබයි. ඔබ දැක ඇති හා භාවිත කරන ලද එවන් ක්‍රියාවලීන් 4ක් සඳහන් කරන්න. (ල. 4)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library